# තෙවැනි වාරය

**06 ශ්‍රේණිය** | **පෙරදිග සංගීතය**

**පළමුවන සතිය (කාලච්ඡේද - 02)**

## මව්පිය ගුණ වරුණ ඇතුලත් විද්‍යුත් මාධ්‍යන්හි ප්‍රචලිත ගිත ගායනය

දෙමව්පියන්ගේ ගුණ වරුණ කියැවෙන ගීත මව්පිය ගුණ වරුණ ගී ලෙස හැඳින්විය හැකිය. ශ්‍රී ලාංකික ගීත කලාව දෙස බැලිමේදී මව්පිය ගුණ වරුණ ගී බොහෝ ප්‍රමාණයක් බිහිවී ඇත. පහත දැක්වෙන්නේ අයියා සහ නංගී අතර තමුන්ගේ දෙමව්පියන් පිළිබඳ ඇතිවූ අදහස් දෙබසක් ආකාරයෙන් ඉදිරිපත් කර ඇති ගීයකි

සුරතල් නංගියේ අපෙ අම්මා
ඇඟ ලේ කැටි කිරි කර නම්මා
පොඩි අවදියෙ අප හට පෙව්හින්දා
අම්මට මම වැනුදා

අයියා කිව්වා මට හරි නෑ
තාත්තා අම්මට වැඩිය අගේ
නිතරම අප ගැන වෙහෙසෙන හින්දා
පියාට මම වැන්දා

නංගී එය හිතුවොත් වැරදී
එතකොට නංගිට පව් සිදු වේ
ඔබ පොඩිකාලේ හුරතල් බල බල
අම්මා දුක්වින්දා

තාත්තා දෙදොලුත් දෙන්නේය
දුන්නම අයියත් කන්නේය
මදිවී තව ඉල්ලන්නෙත් අයියයි
බැන්නෙත් අද අයියයි

**පැවරුම්**

01- ඉහත සඳහන් ගීතය සම්පූර්ණයෙන් වචන සොයා ලියා ගායනයට හුරුවන්න

02- ඔබ දන්නා මව්පිය ගුණ වරුණ ගී යොදා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න

| | අම්මා ගැන කියවෙන ගීත | තාත්තා ගැන කියවෙන ගීත | දෙදෙනා ගැන කියවෙන ගීත |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

03- ඉහත වගුවේ සඳහන් කොටස් තුනට අදාලව ගීත තුනක් සම්පූර්ණයෙන් වචන සොයා ලියන්න

(මාවනැල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමිය, සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂකතුමිය, රඹුක්කන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ රඹුක්කන කොට්ඨාශ සංගීත ගුරු උපදේශකතුමාගේ පූර්ණ උපදෙස් මත සකස්කරණ ලදි.) සුමිත් ප්‍රනාන්දු මයා (කෑ/මාව/දැලිවල මහා විද්‍යාලය)